බලංගොඩ නගර සභාව
රත්නපුර දිස්ත්‍රික්කය
-----------------------------

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජුලි 20 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට බලංගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට දේශීය ණය සංවර්ධන අරමුදලේ ණය සඳහා ගෙවිය යුතු රු. 61,653,691 ක් වූ ණය පොළිය රු. 54,128,411 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ගෙවිය යුතු ණය පොළිය රු. 7,525,280 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට පළාත් පාලන දායක විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල් රු. 49,699 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු රු. 156,743 ක් වූ පුස්තකාල පොත් ගිණුම් ගතකර නොතිබුණි.

(ඈ) 2015 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ අනුව ඉවත් කරන ලද රු. 18,966 ක් වූ පුස්තකාල පොත් ගිණුම් වලින් ගලපා නොතිබුණි.

1.3.2 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්
------------------------------------

(අ) ලැබියයුතු ගිණුම්
--------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2017 දෙසැම්බර් 31 දිනට ආදායම් ණයගැතියන් 108 ක ගෙන් වර්ෂ 06 කට වැඩි කාලයක සිට අයකර ගතයුතු ශේෂ එකතුව රු. 1,202,654 ක් විය.

(ii) ඉකුත් වර්ෂවල සිට ඉදිරියට ගෙන එනු ලැබූ රු. 9,303,601ක් වූ මුදල් මාරු ගිණුමේ ශේෂය 2018 අප්‍රේල් වනවිටත් නිරවුල් කරගෙන නොතිබුණි.

(iii) 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 139,100 ක් වූ කඩ කාමර කුලී 2018 අප්‍රේල් වනවිටත් අයකර ගෙන නොතිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

----------------------

දේශීය ණය සංවර්ධන අරමුදලෙන් බලංගොඩ බස් නැවතුම්පළ සහිත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා ලබාගෙන තිබුණු ණය වෙනුවෙන් 2008 වර්ෂයේ සිට ගෙවිය යුතු ණය වාරික සහ පොළී එකතුව රු. 145,338,240 ක් ගෙවා නොතිබුණි.

1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

--------------------------------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ස්ථාවර වත්කම් සහ ජංගම වත්කම් සනාථ කර ගැනීම සඳහා ස්ථාවර වත්කම් ලේඛනය, විස්තරාත්මක උපලේඛන, කාල විශ්ලේෂණ වාර්තා හා සමීක්ෂණ මණ්ඩල වාර්තා ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 440,897,871 ක් වූ ගිණුම් විෂයයන් 10 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.4 අනුකූල නොවීම්

--------------------

1.3.4.1 නීති ,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

-----------------------------------------------------------------------------

නීති ,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම් |
|---|---|---|---|
| | --------------------------------- | ------------- | --------------- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය XIX වෙනි පරිච්ඡේදයේ **5.6** වගන්තිය | - | නගර සභාවට අයත් නිල නිවාස **05** ක් සඳහා මාසික කුලී අයකිරීමේදී සභා තීරණයකට අනුව මාසික කුලිය රු.**1,500** බැගින් අයකරමින් තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| | (i) මුදල් රෙගුලාසි **104(1)** | 7,760 | පිත්තල මල් පෝච්චි 04 ක ඌනතාවය සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 113 | 33,696,533 | විවිධ අත්තිකාරම් ගිණුමේ වර්ෂ ගණනාවක සිට පැවත එන නොපියවූ අත්තිකාරම් සම්බන්ධයෙන් අධිකාරී බලය ලබා නොගෙන සමුච්චිත අරමුදලට ලියාහැර තිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි **156(1)** | 19,732 | විදුලි බිල්පත් හා ජල බිල්පත් නියමිත දිනයේ දි නොගෙවීම හේතුවෙන් අධිභාර ගෙවා තිබුණද, ඒ සම්බන්ධව වගකිව යුතු අය පිළිබඳව කටයුතු කර නොතිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි **571** | 24,000 | 2015 වර්ෂයේ සිට පවතින හිමිකම් නොපාන ලද ඉකුත් වු තැන්පතු පිළිබඳව ලැයිස්තු පිළියෙල කර තැන්පතු නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | |
| (i) | 5.4.4(i), 5.4.8(අ), 5.4.13(අ) මාර්ගෝපදේශ | 1,728,419 | බැංකියාවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ පැති බැම්ම ඉදිකිරීම සඳහා අත්තිකාරම් ගෙවීමේදී රු. 1,168,841 ක් වැඩිපුර ගෙවා තිබුණි. එමෙන්ම රු. 559,578 ක් වූ කාර්යසාධන සුරක්ෂණය ලබා ගෙන නොතිබූ අතර ගිවිසුම්ගත වීමේදී ඇවර කරන ලද අලාභ ගණනයට අදාලව කොන්දේසි ඇතුලත් කර නොතිබුණි. |
| (ii) | 9.3.1 (ආ) මාර්ගෝපදේශය | 316,745 | රු. 200,000 කට වැඩි අලුත්වැඩියා කිරීම් සඳහා අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතු වුව ද, ට්‍රැක්ටර් රථයක ඇන්ජිම සම්පූර්ණයෙන් අලුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් එකී විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | **2016** දෙසැම්බර් **29** දිනැති අංක **30/2016** දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ **3.1** ඡේදය | - | සභාවට අයත් රථවාහන 36 ක් සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි**.** |
| (ඉ) | පළාත් පාලන කොමසාරිස්ගේ 2009 මාර්තු 09 දිනැති අංක 2009/01 දරන චක්‍රලේඛයේ 1.5 ඡේදය | - | බලංගොඩ බස් නැවතුම්පල වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ලේ කඩ කාමර 143 ක් සඳහා 2005 වර්ෂයේ තක්සේරුව මත බදුකුලී අය කරමින් තිබුණි.තක්සේරු දෙපාර්තමේන්තුව 2015 වර්ෂයේ කරන ලද තක්සේරුව සඳහා බදුකරුවන්ගෙන් විරෝධතා එල්ලවීම නිසා ක්‍රියාත්මක කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,227,735 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 1,888,420 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල්කල ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුලු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුලු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 8,276,000 | 8,372,029 | 8,887,800 | 3,015,177 | 9,359,000 | 8,197,414 | 9,278,165 | 3,530,947 |
| (ii) | කුලී | 28,633,000 | 23,387,731 | 23,031,819 | 942,067 | 20,281,000 | 20,176,773 | 20,267,514 | 586,155 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 4,042,000 | 3,165,883 | 3,165,883 | - | 2,100,000 | 2,843,980 | 2,843,980 | - |
| (iv) | වෙනත් ආදායම් | 25,175,000 | 17,644,659 | 17,509,073 | 1,549,963 | 38,409,000 | 2,850,552 | 28,279,067 | 1,414,377 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 වර්ෂයේ රු. 60,668,726 ක් වූ රැස්කල ආදායම 2017 වර්ෂයේ රු. 52,594,575 ක් වීමෙන් පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රැස්කල ආදායම රු. 8,074,151 කින් අඩු වී තිබුණි.

(ආ) පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී වරිපනම් හා බදු වල ඇස්තමේන්තුගත ආදායම රු. 1,083,000 කින් අඩු වී තිබුණි.

### 2.2.3 වරිපනම් හා බදු

ඉකුත් වර්ෂ සඳහා හිඟව තිබූ වරිපනම් ගාස්තු රු. 2,393,325 ක් අයකර ගැනීමට 2018 අප්‍රේල් වනවිටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015 මැයි සිට 2017 දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයට අදාළව ලැබිය යුතු මුද්දර ගාස්තු හඳුනා ගෙන සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් අයකර ගැනීමට 2018 අප්‍රේල් වනවිටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2017 නොවැම්බර් සහ දෙසැම්බර් මාස වලට අදාළව අයවිය යුතු උසාවි දඩ මුදල් හඳුනාගෙන සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් අයකර ගැනීමට 2018 අප්‍රේල් වනවිටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
------------------------------

3.1 කාර්ය සාධනය
-------------------

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍යය,පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,මහජනතාවගේ සුබ විහරණය ,පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
------------------------------------

ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයට වාර්ෂික අපද්‍රව්‍ය මෙ.ටොන් 5,040 ක ප්‍රමාණයක් එක්රැස් වන අතර එයින් දිරන අපද්‍රව්‍ය කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යොදාගෙන තිබුණි. ප්ලාස්ටික්, පොලිතින් වැනි නොදිරන අපද්‍රව්‍ය ටොන් 2,016 ක් පමණ එකතුවන අතර එයින් මෙ.ටොන් 1,512 ක් පමණ ප්‍රතිචක්‍රීකරණය කර තිබුණි. ප්‍රතිචක්‍රීකරණය කළනොහැකි අපද්‍රව්‍ය වසරකට මෙ.ටොන් 504 බැගින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ එක්රැස් වන අතර ඒවා නායගිය කසල කන්දට ආසන්නයේ වූ විවෘත භූමියක ගොඩගසා තිබුණ ද, එම ද්‍රව්‍ය පරිසරයට අහිතකර නොවන පරිදි බැහැර කිරීමට ක්‍රමවේදයක් 2018 අප්‍රේල් වනවිටත් සකස් කර නොතිබුණි.

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක
------------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව නගර සභාව දැනුවත් වී සිටියද, එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් නගර සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍යය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් 2018 මැයි වනවිටත් සකස් කර නොතිබුණි.

3.2 මානව සම්පත් කළමනාකරණය
----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අනුමත කාර්යය මණ්ඩලයේ ලේකම් තනතුර, පුස්තකාලාධිපති තනතුරු 01 ක්, පෙර පාසල් ගුරු තනතුරු 01 ක්, ආදායම් පරීක්ෂක තනතුරු 03 ක්, ඖෂධ සංයෝජක තනතුරු 01 ක් හා වැඩ කම්කරු තනතුරු 04 ක් පුරප්පාඩුවී පැවතීම නිසා අදාල කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකිරීම සම්බන්ධයෙන් ගැටලු සහගත තත්ත්වයක් ඇති වී තිබුණි.

(ආ ) 2016 මාර්තු 15 දින අංක DMS/D/0217 දරන කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුවේ ලිපිය මගින් බලංගොඩ නගර සභාවේ ගිනිනිවීමේ ඒකකය සඳහා කාර්යමණ්ඩල තනතුරු 20 ක් අනුමත කර තිබූ නමුත්, එම තනතුරු පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබීම හේතුවෙන් ගිනි නිවීමේ ඒකකය 2018 අප්‍රේල් වනවිටත් විධිමත්ව ස්ථාපිත කිරීමට නොහැකි වී තිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2008 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වෙන්දේසි කරන ලද ඉඩම් 07 කට අදාලව කට්ටි සැලැස්ම අනුමත කිරීමට පෙරාතුව විකිණීමට යටත් බිම් කොටස්වල සත්‍ය විකුණුම් වටිනාකම පිළිබඳව තක්සේරුවක් ලබා ගෙන ඒ මත සියයට 01 ක බදු මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද ඉඩම් විකිණීම සඳහා බදු ලේඛනයක් පවත්වා ගෙන යාමට කටයුතු කර නොතිබුණි.

(ආ) කඩ කාමර අතුරු බදු දීම

-----------------------------

බස් නැවතුම්පළ කඩ කාමර බදු දීමට අදාළ ගිවිසුම් ප්‍රකාරව බදුකරු විසින් එකී කඩකාමර හෝ එහි යම් කොටසක බුක්තිය වෙනත් පාර්ශවයකට විකිණීම, පැවරීම හෝ අතුරු බදු දීම නොකළ යුතු වුවද, එකතුව රු. 10,100 ක මාසික කුලියකට බදු දෙන ලද කඩකාමර 02 ක් එකතුව රු. 35,000 කට බදු දී තිබුණි. ඊට අමතරව මහජන පොලෙහි කඩකාමර බදුදීම සඳහා වු ගිවිසුමට පටහැනිව කඩකාමර 07 ක් අතුරු බදු දී තිබුණද, ඒ සම්බන්ධයෙන් 2018 අප්‍රේල් වනවිටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) බදු දුන් කඩකාමර පුලුල් කිරීම

-----------------------------------

බදු ගිවිසුම් අනුව බදුකරුවන් විසින් කඩ කාමරයට හෝ පොදු වෙළඳපොලේ කිසියම් කොටසකට නිර්මාණාත්මක හෝ වෙනත් ආකාරයක වෙනස් කිරීමක් කවර අන්දමකින් හෝ නොකළ යුතු වුවත් මහජන පොළ පිවිසුම ඉදිරිපස කඩ කාමර 02 කට අළුතින් කොටසක් එක්කර විශාලකර තිබුණි. ඊට අමතරව ප්‍රධාන බස්නැවතුම්පලේ කඩකාමර 04 ක එකිනෙකට ගමන් කිරීමට හැකිවන පරිදි ඒවායේ ඇතුළත බිත්ති කඩා සම්බන්ධ කර තිබුණද, සභාව ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ඈ) බලංගොඩ මහජන පොලේ මාළු අලෙවි කිරීම

---------------------------------------------------

මහජන පොලේ පොදු වැසිකිලියට දෙපැත්තෙන් හා ඊට යාබදව ඉදිකරන ලද කඩ කාමර 03 ක් ගබඩා ලෙස භාවිතා කිරීම සඳහා නගර සභාව සමඟ ගිවිසුම් අත්සන් කර තිබුණද, ගිවිසුමට පටහැනිව එම කඩ කාමර මාළු අලෙවි කිරීම සඳහා යොදාගෙන තිබුණි.

(ඉ) නීති විරෝධී ලෙස මත්පැන් අලෙවි කිරීම

---------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2016 මැයි 21 වෙනි වෙසක්පුර පසලොස්වක පෝය දිනයේදී රට බීම මිලි ලීටර් 163,110 ක් බලපත්‍ර කොන්දේසිවලට පටහැනිව සභාවට අයත් බලංගොඩ තානායමේ තබා ගැනිම මත රත්නපුර සහකාර සුරාබදු කොමසාරිස් විසින් 2016 අගෝස්තු 08 දින රු. 1,515,000 ක දඩ මුදලක් සභාවට නියම කර තිබුණි. එම දඩ මුදල ගෙවීම සඳහා ඇති කර ගත් එකඟත්වය අනුව වාරික 09 කින් ගෙවා තිබුණි.

(ii) සභාව විසින් ගෙවන ලද රු. 1,515,000 ක් වූ දඩ මුදල් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීම සඳහා විත්තිකරුවන් තිදෙනෙකුට එරෙහිව බලංගොඩ දිසා අධිකරණයේ පවරන ලද නඩුවේ චෝදනා ලෙස "සුරාබදු නිලධාරීන් විසින් මත්පැන් අතිරික්ත තොග තබාගැනීම සම්බන්ධයෙන් වැටලීමක් කර තානායම සීල් තබන ලදී" යන්න දක්වා තිබුණි. එහෙත් සුරාබදු ආඥාපනතේ 27 වෙනි වගන්තිය යටතේ බලපත්‍රය අවලංගු කිරීමේ/අත්හිටුවීමේ නිවේදනයේ සඳහන් කර තිබුණු රජයේ නියමය පරිදි බලපත්‍ර ස්ථානය වසා තැබිය යුතු වෙසක් මස පුර පසලොස්වක පොහොය දිනයේදී මත්පැන් විකිණීම, අනුමත නොකල ස්ථානයකින් මත්පැන් රැගෙන විත් බලපත්‍ර ස්ථාන පරිශ්‍රයේ ගබඩාකර තිබීම, වාරණපත් නොමැතිව මත්පැන් තානායමට ලබා ගැනිම හා ර.බී.12 බලපත්‍රයෙන් අනුමත නොවන ස්ථානයක මත්පැන් ගබඩා කිරීම යන කරුණු නගර සභාව විසින් පවරන ලද නඩුවේ චෝදනා ලෙස ඇතුලත් කර නොතිබුණි.

3.4 වත්කම් කළමණාකරණය

------------------------------

නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවට පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු වටිනාකම රු. 24,928,666 ක් වූ මෝටර්ග්‍රේඩර් යන්ත්‍රය 2015 වර්ෂයේ සිට ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව තිබුණි.

(ආ) සභාව විසින් 2013 සැප්තැම්බර් මාසයේදී රු. 1,900,000 කට මිලදී ගෙන තිබුණු කම්පන මාර්ග තලන යන්ත්‍රය 2016 වර්ෂයේ සිට ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව තිබුණි.

3.5 ප්‍රසම්පාදන සැලැස්ම

--------------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4 වැනි පරිච්ඡේදයේ 4.2.1 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව සභාව විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට කටයුතුකර නොතිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

-------------------------------------------

4.1 අයවැය පාලනය

---------------------

ප්‍රාග්ධන වියදම් සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු. මිලියන 46.35 ක් වූ අතර එහි තත්‍ය වියදම රු. මිලියන 26.53 ක් වීමෙන් ප්‍රතිපාදනයෙන් රු. මිලියන 19.83 ක් හෙවත් සියයට 43 ක් ඉතිරි වී තිබුණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදවා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර ලේකම්වරියගේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන නොකිරීම |
| | | (ii) | ආදායම්, වියදම් හා වත්කම්, බැරකම් අඩුවෙන් හා වැඩියෙන් ගිණුම්ගත කිරීම |
| | | (iii) | ලෙජර් ගිණුම් ශේෂ හා ලේඛන නොසැසඳීම |
| (ආ) | වාහන පාලනය | (i) | වාහන ලේඛනය යාවත්කාලීන නොකිරීම |
| | | (ii) | වාහනවල ඉන්ධන පරික්ෂාව සිදු නොකිරීම |
| (ඇ) | අයවැය පාලනය | (i) | වැය ප්‍රතිපාදනවල සැලකිය යුතු ප්‍රතිපාදනයන් ඉතිරිව තිබීම |
| (ඈ) | ආදායම් පරිපාලනය | (i) | ඇස්තමේන්තුගත ආදායම් අයකර නොගැනීම |
| | | (ii) | හිඟ ආදායම් අයකර නොගැනීම |
| (ඉ) | සේවක කළමනාකරණය | | පුරප්පාඩු සම්පූර්ණ කර නොගැනීම |